# දනගිරිගල රජ මහා විහාරය

කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇති විහාර අතරින් පැරණිතම ලෙන් විහාරයක් ලෙස දනගිරිගල රජ මහා විහාරය හැඳින්විය හැකිය. අතීතයේදී හදුන්වා ඇත්තේ වඩ්ඩමාන පබ්බත හෙවත් වඩුගන්නා ගල්පාය වශයෙනි.

මෙම ස්ථානය පිළිබඳ ජනප්‍රවාද තොරතුරු අනුව බුදුරදුන්ගේ ජීවමාන සමය දක්වා ඈත අතීතයට දිව යයි. බුදුරදුන්ගේ දෙවන ලංකාගමනය සිදුවන්නේ චූලෝදර - මහෝදර නාග යුද්ධය සන්සිඳවීම සඳහාය. මෙහි චූලෝදරගේ පියා වඩුගන්නාගල (වඩ්ඩමාන පබ්බත) විසූ නාග රාජයෙකි. එය රට මැද පිහිටියේ යැයි වංශකතා වල සඳහන් වේ.

දනගිරිගල යනු එම වඩුගන්නාගල බව කියනු ලැබේ. චූලෝදරගේ පියා මෙහි විසූ බව කියවෙන පුවතින් පෙනීයන කරුණ වන්නේ එම යුගයේදී මෙම පෙදෙස නාග ගෝත්‍රික ජනාවසයක්ව පැවති බවයි. ආර්යයාගමනයෙන් පසුව ස්වදේශීය ජනයා හා මිශ්‍රවී ගිය පසු ඔවුන් එක්ව ජනාවාස ගොඩනංවා ගත්බව පැහැදිලිය.

ස්වදේශීය ජනයා මෙහි ජීවත්වූ බවට ප්‍රාග් ඓතිහාසික සාධකද හමුවේ. ඒ අනුව මුල්ම ආර්යය ජනයා කදුකර පෙදෙස් කරා පැතිර ගිය බවට සාධක සපයන ස්ථානයක් වශයෙන් වැදගත්වේ.

මෙම ස්ථානය සඳහා මුල්ම රාජ්‍ය අනුග්‍රහය ලැබෙන්නේ අනුරාධපුරයේ රජකල වළගම්බා රජු සමයේදීය. නැවත පොළොන්නරු යුගයේදී විජයබාහු රජු වානගිරි පබ්බතයේ සටන් සංවිධානය කරන අතරතුර දනගිරිගල හා සබදතා පවත්වා ඇත. මෙම ස්ථානයද තම ආරක්ෂිත ස්ථානයක් වශයෙන් තෝරාගන්නට ඇත. නැවත කුරුණෑගල යුගයේ රජකළ පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ පුත් විජයබාහු කුමරුගේද අනුග්‍රහය ලැබී ඇත.

ඉන්පසුව අරාජික තත්වයට පත්ව තිබූ මෙම ස්ථානය වර්තමානයේ දක්නට ඇති තත්වයට ගොඩනැංවීමට මූලිකවී ඇත්තේ සතර කෝරලයේ දිසාවනිය ලෙස සේවය කළ ලෙව්කේ අධිකාරම විසිනි. ඒ අනුව රාජසිංහ රජු තම අනුග්‍රහය දක්වා ස්ථානයේ පැවැත්ම සඳහා ඉඩකඩම් පූජාකර සන්නසක්ද ලබාදී ඇත.

අනුරාධපුර සමයේ සතර කෝරළය බෙදා ප්‍රදේශයේ සුප්‍රසිද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන හතරක් විය. ඒවානම් රාජශිව මල්පාය, බ්‍රග්මවස්ථානය, මලියමහාපය හා වඩුගන්නා ගල්යපායි. මෙහි සිව්වැන්නවූ වඩුගන්නා ගල්පාය පසුව දනගිරිගල බව සදහන්වේ.

වර්තමානයේ විහාරය තුල දක්නට ලැබෙන මූර්ති කැටයම් සහ සිත්තම් මහනුවර යුගය නියෝජනය කරයි. මහනුවර යුගයේ ආර්ථික, දේශපාලන, සමාජමය හා සංස්කෘතිමය යන සියලු අංශ ගැන අවබෝධයක් ලබා ගැනීම සඳහා සුදුසුම ස්ථානයකි. මහනුවර යුගයේ කලාගාරය බදු දනගිරිගල රජමහා විහාරය වර්තමානයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත සංරක්ෂණ කටයුතු සිදුකෙරේ.